# චරක සංහිතාවේ අන්තර්ගත අනිත්‍ය, අනාත්ම හා ක්‍ෂණභංගුරවාදය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

# An Analytical Study of Impermanent, Non-self and Evanescent with Special Reference to *CharakaSamhitha*

එස්. පී. මොල්ලිගොඩ[1], කේ. අයි. ඩබ්. කේ. සෝමරත්න[2]

**හැඳින්වීම සහ පර්යේෂණ ගැටලුව.**

චරක සංහිතාවයනු ආයුර්වේදය පිළිබඳව රචිත ප්‍රධාන ග්‍රන්ථත්‍රය වන 'වෘහත්ත්‍රයී' අතුරින් ප්‍රධාන චිකිත්සා ග්‍රන්ථයයි. ආයුර්වේද ඥාන සාධනයෙහි ලා අතිශයින්ම අවශ්‍ය වන උපදේශවලින් හෙබි චරකය ඊට පසුව ලියවුණු සියලු සංග්‍රහයන්ට ගුරු වී තිබෙනු දැකිය හැකිය. අග්නිවේශ තන්ත්‍රයේ ප්‍රතිසංස්කරණයක් සේ සැළකෙන චරක සංහිතාව ප්‍රතිසංස්කරණය කරන ලද්දේ කාශ්මීරයේ විසූ චරක නම් වූ ඍෂිවරයාය. ඔහු බෞද්ධ මහායානික භික්ෂුවක් බව ප්‍රචලිතය. එසේම එතුමා ක්‍රි.ව. දෙවන හෝ තුන්වන සියවසේ ජීවත්වන්නට ඇතැයි අනුමාන කෙරේ. බෞද්ධ දර්ශනයේ මූලික හරය අනිත්‍ය හා අනාත්මයයි. යමක් විශ්වය පුරා පැතිර පවතීද, යමක් එක් සිරුරක් හැර අනෙක් සිරුරක් අල්ලා ගනීද, යමක් මෙලොව විෂය රස වළඳයිද, යම් හෙයකින් යමකගේ නිරතුරු පැවැත්මක් ඇද්ද එහෙයින් එය ආත්මය කියැයි කියනු ලැබේ. මෙහි සඳහන් "නිරතුරු පැවැත්ම " යනු නොවෙනස්වන සදාකාලික තත්ත්වයකි. එනමුත් "සබ්බේ ධම්මා අනත්තා"යනු බුද්ධ දේශනාවයි. බෞද්ධ භික්ෂුවක් වන චරක ආචාර්යවරයා විසින් පරිපූරිත චරක සංහිතාවේ අනිත්‍ය හා අනාත්මය පිළිඹිබු වන හෝ ක්‍ෂණභංගවාදය පිළිබඳව දාර්ශනික මතවාද සාකච්ඡා වී තිබේද යන්න මෙහි ඇති පර්යේෂණ ගැටළුවයි. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ චරක සංහිතාවේ අන්තර්ගත අනාත්මවාදය හා ක්‍ෂණභංගුරත්වය පිළිබඳව කරුණු හඳුනා ගැනීම හා විමර්ශනය කිරීමයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය වන්නේ දාර්ශනික විමර්ශනයයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙෂ චරක සංහිතාව භාවිතා කරන ලදී. ද්විතීයික මූලාශ්‍ර ලෙස සඟරා, ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි ලේඛන භාවිතා කෙරුන අතර අවශ්‍ය පරිදි අන්තර්ජාල පරිශීලනය සිදු කෙරිණි. ලෝකයේ ඇති සවිඤ්ඤාණක වූත්, අවිඤ්ඤාණක වූත්, සියලු පදාර්ථ අනිත්‍ය මූලික වේ. වේද, උපනිෂද් හා හින්දු

[1]කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යායතනය රාජගිරිය
*(susanthamolligoda@gmail.com)*
[2]කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යායතනය රාජගිරිය

සංස්කෘතික පසුබිමක ලියවුණු චරක සංහිතාවේ විවිධ ස්ථානයන්හි ක්ෂණභංගුරත්වය හා ලොවෙහි පවත්නා අනිත්‍ය පිළිබඳ මතවාද සඳහන්ව ඇති බව මෙම පර්යේෂණයෙහි සනාථ වී පවතී.

අනිත්‍යය පහදාලන තැන්හි දී "සබ්බේ සංඛාරා අනිච්චා" සියලු සංස්කාර අනිත්‍යවේ" යනුවෙන් බුදුහු වදාළහ. මෙහි "සංස්කාර"යනු ඒ ඒහේතු ප්‍රත්‍ය අනුව සකස් වූ ස්කන්ධයන්ය. එසේ නොවන නොයෙක් ද්‍රව්‍ය අනුපාදින්නක ස්කන්ධයෝය. (සත්ව ශරීර නාම, රූප වශයෙන් බෙදා බලන විට මේ දෙවර්ගයේම ස්කන්ධ කොටස් එහිද ඇති බව පෙනේ)මෙසේ පටිච්ච සමුප්පන්නව හෙවත් හේතු ප්‍රත්‍ය නිසා ඇතිවන මොන දේ වුවත් ඒ ඒ හේතු ප්‍රත්‍යයන් වෙනස් වන පරිදි අනික් අවස්ථාවකට හෝ තත්වයකට හෝ පත්වේ. 'අනිච්ච' යනු ඒ වෙනස හැඳින්වීම සඳහා බුදුරජාණන්වහන්සේ වදාළ වචනයයි. අනිත්‍ය, එනම් කිසියම් ජීව අජීව වස්තුවක් වෙනස්වීම ඇතැම් විට කෙනෙකුට අනායාසයෙන් තේරුම් ගත නොහැකියි. එහෙත් ලෝකයේ සදාකාලික වූත්, ස්ථිර වූත්, නිත්‍ය වූත් තත්ත්වයන් නොපවතී යන්න බෞද්ධ දාර්ශනික මතයයි. මෙම මතය සනාථ කෙරෙන කරුණු චරක සංහිතාවේ අන්තර්ගතද යන්න මෙහිදී ඇතිවූ පර්යේෂණ ගැටළුවයි

චරක සංහිතාවේ අන්තර්ගත අනිතය, අනාත්මය හා ක්ෂණභංගුරවාදය පිළිබඳ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මුඛ්‍ය ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ චරක සංහිතාවයි. ද්විතීක මූලාශ්‍ර වශයෙන් පර්යේෂණ ලිපි ලේඛන යුක්ති යුක්තව පරිශීලනය කරන ලදී. එසේ ආයුර්වේද සිද්ධාන්ත හා බෞද්ධ දාර්ශනික සිද්ධාන්ත අලලා ලියන ලද පර්යේෂණ කෘති භාවිතා කර ඇත. අවශ්‍ය විට අන්තර්ජාලය භාවිත කර ඇත.

## සාකච්ඡාව ප්‍රතිඵල හා නිගමන

ආදි යුගයේ පටන්ම මිනිසා තුළ මැවීම පිළිබඳ බරපතල විශ්වාසයක් ගොඩනැගී ඇතිබව බෞද්ධ දාර්ශනය හැර සියලු ආගම් පිළිබඳව විමර්ශනය කිරීමෙන් පෙනීයයි. මැවීමේ විශ්වාසයට අනතුරුව ඔවුහු තමන් තුළ සිතීම්, විඳීම්, හැඳිනීම්, සිහි තබා ගැනීම් ආදිය කරන ආත්මයක් ඇතැයි සිතන්නට පටන් ගත්හ. මේ පිළිබඳ ලිඛිත මූලාශ්‍ර මහා භාරතය, උපනිෂද්, ආරණ්‍යක ආදි ග්‍රන්ථ තුළින් හමුවෙයි. මිනිසා තුළ සැඟවී ඇති ආත්මය යව ඇටයක ප්‍රමාණයෙන් යුක්ත බව බෘහදාරණ්‍යක උපනිෂද්හි කියා ඇත. වෙන් වෙන්ව පවතින ආත්ම මෙන්ම සර්වව්‍යාපී ආත්ම පිළිබඳ විශ්වාස මිනිසා තුළ මුල් බැස ගත් වහාම සදාකාලිකව වෙනස් නොවී පවතින ආත්ම සංකල්පය ස්ථාපිත විය. සර්ව ව්‍යාපී පරම ආත්මයත් සත්ත්වයන්

තුළ පවත්නා ආත්මයත් අතර වෙනසක් නැත යන අද්වෛතවාදය ඉන්පසුව ස්ථාපනය විය. ආදිම ශිෂ්ටාචාරය පැතිර ගිය ජම්බුද්වීපයේ පමණක් නොව මිසරය, ග්‍රීසිය, චීනය, ජපානය ආදී රටවල මෙන්ම වර්තමානය වන විට යුරෝපය පුරාම පැතිර ඇත්තේද මෙම ආත්ම පිළිබඳ සංකල්පයයි. මෙසේ ශිෂ්ට වූ හැම රටකම ආත්මවාදය දියුණු වූ එයට විරුද්ධ වාදයක් උපදවන ලද්දේ භාරතයේ පමණි. ජීව ආත්මය, පරම ආත්මය යන දෙකම හැර දමා සත්ත්වයන්ට දුකින් නිදහස් වීමේ මග දේශනා කර අනාත්ම වාදය ගෙන හැර දැක්වූයේ සිද්ධාර්ථ ගෞතමයන් විසිනි.

ආයුර්වේදය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයේදී චරක සංහිතාව එය මෙසේ විස්තරකරයි. "මේ ආයුර්වේද තෙම, ආදියක් නැති හෙයින් ද, ඉබේ පැන නැගුණු ලකුණු ඇති හෙයින් ද භාවය හා ස්වභාවය පිළිබඳ නිත්‍යතාව ඇති හෙයින් ද නිත්‍ය යැයි නිර්දේශ කරනු ලැබේ." එසේම මෙම ආයුර්වේදය නිත්‍ය යැයි පවසන පරිදිම ආයුෂය පිළිබඳ වේදිතෘ (ඥානි) තෙමේ ද නිත්‍ය යැයි පැවසේ. චරක සංහිතාව අග්නිවේශ තන්ත්‍රයේ සංස්කරණයක් වීම හා අග්නිවේශ තන්ත්‍රය බුද්ධ කාලයට ප්‍රථම ලියවී තිබීම මෙම මතයනන් චරක සංහිතාවට ප්‍රවිශ්ට වීම පිළිබඳ කාරණය වූවා යැයි නිගමනය කිරීමට බාධාවක් නැත. එසේ වුව ද අග්නිවේශ තන්ත්‍රයේ සඳහන් කරුණු වලට අමතරව චරක ආචාර්යවරයා විසින් විශාල පරිච්ඡේද ප්‍රමාණයක් මෙම ග්‍රන්ථයට ප්‍රවිෂ්ඨ කර ඇති බව විද්වත් මතයයි.

චරක සංහිතාවේ සූත්‍ර ස්ථානයේ දෝෂ හා ධාතු පිළිබඳව දැක්වීමේ දී මෙසේ සඳහන් වේ. හේතූන්ගේ විෂමත්වය නිසා දේහ ධාතුහු විෂම වන බවත්, හේතූන්ගේ සමතාවය නිසා දේහ ධාතූන් සම වන බවත් සඳහන් කරයි. නමුත් ඒ විෂම වන හා සමවන සියලු ධාතූන්ගේ විනාශය සෑමවිටම ඇසිල්ලක් පාසාම සිදු වන බව දැක්වේ. මෙය සියල්ලම සෑම මොහොතක මවිනාශ වන හෙවත් ක්‍ෂණභංගුරත්වය විදහා පාන අවස්ථාවකි. එසේම උත්පත්තියට හේතුවක් ඇතිවුවත් විනාශයට හේතුවක් නැති බව චරක සඳහන් කරයි. මෙමගින් හේතු ප්‍රත්‍ය සම්බන්ධය සනාතන සත්‍යක් බව පිළිගන්නා අතර සියල්ල සෑම මොහොතකම විනාශ වන බව පෙන්වාදෙයි. මෙම කරුණු දෙකෙන්ම අනාත්ම බව හා ක්‍ෂණභංගුරත්වයට සාක්ෂි සැපයේ.

**ප්‍රමුඛපදඃ** ක්‍ෂණභංගුරත්වය (Kshanabhangurathwaya), අනාත්මවාදය (Anathmawadaya), ආත්මය (Athmaya), දෝෂ (Dosha), ධාතු (Dhathu), අනියත (Anithya)

## ආශ්‍රිත ග්‍රන්ථ


කුමාරසිංහ, ආරියදාස (1993) *චරකසංහිතාව ප්‍රථම භාගය*, ආයුර්වේද දෙපාර්තමේන්තුව

කුමාරසිංහ, ආරියදාස (1993) *චරකසංහිතාව දෙවන භාගය*, ආයුර්වේද දෙපාර්තමේන්තුව

බුද්ධදත්ත, පොල්වත්තේ, (2002) *ථෙරවාද බෞද්ධ දර්ශනය*, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන

පඤ්ඤාකිත්ති, හිරිපිටියේ, (1996) *බෞද්ධ දර්ශනය*, ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව

*බෘහදාරණ්‍යක උපනිෂද්*